# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2014

## සමුපකාර සේවක කොමිෂන් සභාව

අංකඃ100 1/1, ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ - 02

# දර්ශනය

තෘප්තිමත්
සමුපකාරික මානව සම්පතක් නිර්මාණය
කිරීම

# මෙහෙවර

සමුපකාර ව්‍යාපාරයේ තිරසාර පැවැත්ම උදෙසා එම ක්ෂේත්‍රයෙහි
මානව සම්පතෙහි අභිවෘද්ධිය
පිණිස අවශ්‍ය ප්‍රතිපත්ති සකස්කිරීම.

# කාර්යයන්

..

- සමුපකාර සමිතිවලට සේවකයින් බඳවා ගැනීමේදී උසස් කිරීමේදී සහ ඔවුන්ට හිමි පාරිතෝෂික දීමනා ලබාදීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීම.

- සමුපකාර සමිතිවල තනතුරුවලට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීම හා එම තනතුරු වලට අදාළ වැටුප් පරිමාණයන් නියම කිරීම.

- සේවක ආරවුල් විසඳීම, අභියාචනා විභාග කිරීම සහ නියෝග ක්‍රියාත්මක කිරීම පැහැර හරින සමුපකාර සමිතිවලට එරෙහිව නීතිමය පියවර ගැනීම.

- කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරෙන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම.

- ස්වකීය සේවකයින් සම්බන්ධයෙන් වූ විනයානුකූල ක්‍රියාමාර්ගයන්හිදී සමුපකාර සමිති විසින් අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටිය/ක්‍රියාපටිපාටින් තීරණය කිරීම.

- මානව සම්පත් සංවර්ධනය කිරීමේ සාකච්ඡා සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

# සමුපකාර සේවක කොමිෂන් සභාව - වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2014

සමුපකාර සේවකයින්ගේ සේවා සුරක්ෂිතතාව සහ ශුභසිද්ධිය උදෙසා සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් 2014 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ සියළු කාර්යයන් පිළිබඳ විස්තරාත්මක හා සංඛ්‍යාත්මක තොරතුරු ඉදිරිපත්කිරීම මෙම වාර්තාව මඟින් සිදුකර ඇත.

මූලික වශයෙන් පහත සඳහන් පරිච්ඡේදවලින් සමන්විත වන පරිදි මෙම වාර්තාවෙහි අන්තර්ගතය සකස්කර ඇත.

* **පළමු පරිච්ඡේදය**

  සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංයුතිය හා 2014 වර්ෂය තුළ සේවා නියුක්තිය පිළිබඳ කරුණු.

* **දෙවන පරිච්ඡේදය**

  කොමිෂන් සභාවේ විෂය පථයට අයත්, මුදුන් මට්ටමේ සමුපකාර සමිතිවල නාම ලේඛනය හා 2014 වර්ෂය තුළ එම සමිතිවල සේවයේ යෙදී සිටි සේවකයින් පිළිබඳ කරුණු.

* **තුන්වන පරිච්ඡේදය**

  කොමිෂන් සභා කාර්යාලයේ භෞතික හා මූල්‍ය කටයුතු සහ 2014 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් සිදුකරන ලද සමස්ථ කාර්යයන් සමාලෝචනය කිරීම.

# පටුන

**පිටුව**

**I. පරිච්ඡේදය**


- කොමිෂන් සභාවේ සංයුතිය,පාලන කටයුතු, හා සංවිධාන ව්‍යුහය.......................................... 07
- කාර්ය මණ්ඩලය හා 2014 වර්ෂයේ සේවා නියුක්තිය.................................................................. 08-09


**II. පරිච්ඡේදය**


- මුදුන් මට්ටමේ සමුපකාර සමිති හා එම සමිතිවල 2014 වර්ෂයේ සේවා නියුක්තිය.................................................................................................. 11-13


**III. පරිච්ඡේදය**


- 2014 වර්ෂයේ භෞතික හා මූල්‍ය කාර්යඵල සාධනය................................................................ 15-19
- වර්ෂය තුළ කරන ලද සාමාන්‍ය හා විශේෂිත කාර්යයන් සමාලෝචනය............................... 20-28

# I පරිච්ඡේදය

- ❖ කොමිෂන් සභාවේ සංයුතිය, පාලන කටයුතු, හා සංවිධාන ව්‍යුහය

- ❖ කාර්ය මණ්ඩලය හා 2014 වර්ෂයේ සේවා නියුක්තිය

# සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංයුතිය හා පාලන කටයුතු

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතෙහි 4 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුව සමුපකාර විෂය භාර ඇමතිවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ. එම සාමාජිකයින් තිදෙනාගෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් පත් කරන අතර, එකී සාමාජිකයින් තිදෙනාම තම පත්වීමේ දින සිට අවුරුදු 03 ක කාලසීමාවක් සිය ධූරයන් දැරිය යුතු වේ. එසේ වුවද සාමාජිකයෙකුගේ ඉල්ලා අස්වීම, ඇමතිවරයා විසින් එකී ධූරයෙන් ඉවත් කිරීම, මිය යෑම වැනි කරුණු වලදී හිස් වූ පුරප්පාඩුවක් පිරවීමට තුන් අවුරුදු කාලයෙන් ඉතිරිව ඇති කාලයට වෙනත් සුදුසු අයෙකු පත් කිරීමට ඇමතිවරයාට හැකි වේ.

2014 වර්ෂයේ දී කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස නීතීඥ ඩී.එම්. අරුණ කීර්ති දසනායක මහතා කටයුතු කළ අතර, සෙසු සභිකයින් ලෙස නීතීඥ ඩබ්ලිව්.මංජුල විජේවර්ධන මහතා, එම්.ඩබ්ලිව්.එච්.කමල් ජයරත්න මහතා කටයුතු කරන ලදී.

1972 සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙම කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ  නිලධාරියකු පත් කළ යුතුය. එකී ලේකම්වරයා මෙම දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා ද වේ.


මේ වන විට මෙම කොමිෂන් සභාවේ වැඩ බලන ලේකම් ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමුවන පන්තියේ නිලධාරියකු වන ආහාර සුරක්ෂිතතාව අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ඩබ්.ඒ.ධම්මික රාජපක්ෂ මහතා කටයුතු කරයි.

1972 සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයෙහි සෙසු සාමාජිකයින් ඒකාබද්ධ සේවාවන්ගෙන් පත් කරනු ලැබේ.

1972 සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 12 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ වියදම් මහා භාණ්ඩාගාර  වාර්ෂික විසර්ජන පනත යටතේ වෙන් කරනු ලබන මුදල් වලින් සිදු කෙරේ. 2014 වර්ෂයේ වැය ශීර්ෂ 302 යටතේ විසර්ජන පනතින් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

## කාර්ය මණ්ඩලය හා 2014 වර්ෂයේ සේවා නියුක්තිය

### සමුපකාර සේවක කොමිෂන් සභා සංවිධාන සැලැස්ම



**2014 වර්ෂයේ සේවා නියුක්තිය**

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2014.12.31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ලේකම් | 01 | 01 (වැඩ බලන) | - |
| ගණකාධිකාරී (නි/ලේකම්-මුදල්) | 01 | 01 | - |
| නීති නිලධාරී | 01 | - | 01 |
| පරිපාලන නිලධාරී (රාජ්‍ය කළමණාකාර සහකාර - අධි ශ්‍රේණිය) | 01 | (අභ්‍යන්තර සේවකයකුගෙන් වැඩ ආවරණය කර ගනී) | 01 |
| රාජ්‍ය කළමණාකාර සහකාර (I/II/III ) | 08 | 07 | 01 |
| සංවර්ධන නිලධාරි | 05 | 02 | 03 |
| රියදුරු | 03 | 03 | - |
| කාර්යාල කාර්ය සහායක (I/II/III) | 03 | 02 | 01 |
| **එකතුව** | **23** | **16** | **07** |

**නව පත්වීම් ලැබ පැමිණි නිලධාරින්**

| නම | තනතුර | දිනය |
|---|---|---|
| එම්.ඩී.එස්. මනමේන්ද්‍ර මහතා | කළමනාකරණ සහකාර | 2014.01.06 |
| ජේ.ඒ.ටී.පී. ජයකොඩි මෙනවිය | කළමනාකරණ සහකාර | 2014.01.06 |
| එච්.එස්. ප්‍රේම කුමාර මහතා | කාර්යාල කාර්ය සහයක III | 2014.04.04 |
| එස්.ඒ.එම්.එස්. විජේරත්න මහතා | රියදුරු | 2014.04.04 |
| ටී.එස්. රාජපක්ෂ මහතා | රියදුරු | 2014.11.27 |

**ස්ථාන මාරු වී ගිය සහ ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරින්**

| නම | තනතුර | ස්ථාන මාරු වී ගිය දිනය | ස්ථාන මාරුවී පැමිණි දිනය |
|---|---|---|---|
| එල්.එන්. දමයන්ති මහත්මිය | කළමනාකරණ සහකාර | 2014.05.09 | - |
| එස්. ඊ. එම්. ඩබ්. එස්. ඒකනායක මෙනවිය | සංවර්ධන නිලධාරී | 2014.06.26 | - |
| ටී.ඩී. ජගත් රූපසිංහ මහතා | කාර්යාල කාර්ය සහයක III | 2014.08.29 | - |
| එච්. ඩී. එම්. ඩී. කුලතුංග මහත්මිය | සංවර්ධන නිලධාරී | 2014.11.01 | - |

# II පරිච්ඡේදය

- මුදුන් මට්ටමේ සමුපකාර සමිති හා එම සමිති වල 2014 වර්ෂයේ සේවා නියුක්තිය

# මුදුන් මට්ටමේ සමුපකාර සමිති

සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අධීක්ෂණයට යටත් වන ජාතික මට්ටමේ සමුපකාර සමිතිවල සිටින සේවකයින්ගේ සේවාවන්ට අදාළ වන කරුණු පිළිබඳව නියාමනය කිරීම මෙම කොමිෂන් සභාවට පැවරී ඇත. සමුපකාර සේවකයින්ගේ සේවා ප්‍රශ්න විසඳීම පමණක් නොව තනතුරු සඳහා, සුදුසුකම් තීරණය කිරීම, වැටුප් ප්‍රතිශෝධනය කිරීම, වැනි කටයුතු ද මෙම කොමිෂන් සභාව මඟින් ඉටුකරනු ලැබේ. මේ හැරෙන්නට අවශ්‍ය අවස්ථාවන්හිදී පළාත්බද සමුපකාර සේවා කොමිෂන් සභාවලට යම් යම් පැහැදිලි කිරීම් හා උපදෙස් ලබාදීම ද ජාතික වශයෙන් පොදු ඒකගතාවකින් යුතුව කටයුතු කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම් සිදුකිරීමද මෙම කොමිෂන් සභාව මඟින් ඉටු කරනු ලැබේ. පහත සඳහන් සමුපකාර සමිතිවල සේවකයින්ගේ සේවා සම්බන්ධ සියළුම කටයුතු මෙම කොමිෂන් සභාව මඟින් නියාමනය කරනු ලැබේ.

## මුදුන් මට්ටමේ සමුපකාර සමිති වල 2014 වර්ෂයේ සේවානියුක්තිය

| | සමිතියේ නම | සේවක යින් ගණන |
|---|---|---|
| | **සමුපකාර සංගම්** | |
| 01 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | 59 |
| 02 | සී/ස ශ්‍රී ලංකාවේ සණස මහා සංගමය | 18 |
| 03 | සී/ස ශ්‍රී ලංකා පේෂකර්ම සමුපකාර සමිති සංගමය | 05 |
| 04 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | 111 |
| 05 | සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය | 03 |
| 06 | සී/ස ශ්‍රී ලංකා තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිති මහා සංගමය | 01 |
| 07 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය | 14 |
| 08 | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය | 162 |
| 09 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | 31 |
| 10 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය | 41 |
| 11 | සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණසේවා සමුපකාර සමිති සංගමය | 13 |
| 12 | සී/ස. ශ්‍රී ලංකා සම්පත් කළමනාකරණ සමුපකාර සන්ධානය | 03 |

| දීප ව්‍යාප්ත ණය දෙන සමිතිය | | |
|---|---|---|
| 13 | සී/ස. අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 777 |
| 14 | සී/ස. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය. | 76 |
| 15 | සී/ස. දුම්රිය ස්ථානාධිපති හා ලිපිකරු සමුපකාර ණය දෙන සමිතිය | 04 |
| 16 | සී/ස. තැපැල් හා විදුලි සංදේශ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 39 |
| 17 | සී/ස. බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සමුපකාර ණය දෙන සමිතිය | 01 |
| 18 | සී/ස සණස සංවර්ධන බැංකුවේ සේවක ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 09 |
| 19 | සී/ස රජරට විශ්ව විද්‍යාලීය සමුපකාර සමිතිය | 06 |
| 20 | සී/ස වරාය නැව් සේවා සමුපකාර සමිතිය | 07 |
| 21 | සී/ස ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ සමස්ත සේවකයින්ගේ ණය දෙන සමිතිය | 09 |
| 22 | සී/ස. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය | 02 |
| 23 | සී/ස. සමෘද්ධි සංවර්ධන, කෘෂිකාර්මික සහකාර නිලධාරීන්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 05 |
| 24 | සී/ස. රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය සමුපකාර ණය ගනුදෙනු පිළිබඳ සමිතිය | 06 |
| 25 | සී/ස රාජ්‍ය සේවා උපාධිධාරී ස.ණ.ස. | 11 |
| 26 | සී/ස. දුම්රිය මාර්ග වැඩ දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය | 01 |
| 27 | සී/ස වරාය අධිකාරිය සේවක සමුපකාර බැංකුව | 18 |
| 28 | සී/ස. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය | 34 |
| 29 | සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරිකිරීම් සමුපකාර ණය දෙන සමිතිය | 23 |
| 30 | සී/ස. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු සේවකයින්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 02 |
| 31 | සී/ස. ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 02 |
| 32 | සී/ස. ශ්‍රී ලංකාවේ කාන්තා සංවර්ධන සේවා සමුපකාර සමිතිය | 75 |
| 33 | සී/ස. මහජන බැංකු සේවක සමුපකාර ණය දෙන සමිතිය | 05 |
| 34 | සී/ස. කොළඹ මහාරෝග්‍යශාලිය සේවක ස.ණ.ස | 10 |
| 35 | සී/ස. ලංගම සේවක සකසුරුවම් හා සුබසාධක සමුපකාර සමිතිය | 06 |
| 36 | සී/ස. රාජ්‍ය සේවා සමුපකාර ණයදීමේ හා ඉතිරිකිරීමේ සමිතිය. | 32 |

| | | |
|---|---|---|
| 37 | සී/ස. ස.තො.ස සේවකයින්ගේ සමුපකාර ණය දෙන සමිතිය | **04** |
| 38 | සී/ස.  ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සුභසාධක ස.ණ.ස | **19** |
| 39 | සී/ස. ශ්‍රී ලංකා මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකවරුන්ගේ සමුපකාර ස | **07** |
| 40 | සී/ස. වතු සේවා නිලධාරීන්ගේ නිවාස සමුපකාර සමිතිය | **02** |
| 41 | සී/ස. සමුපකාර දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ සමුපකාර ණය දෙන  සමිතිය | **07** |
| | **වෙනත් සමිති** | |
| 42 | සී/ස. සමස්ත ලංකා සුළු හා මධ්‍යම පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය | **01** |
| 43 | සී/ස. ශ්‍රී ලංකා වානේ කර්මාන්ත සමුපකාර සමිතිය | **08** |
| 44 | සී/ස. සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | **07** |
| 45 | සී/ස. මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | **14** |
| 46 | සී/ස. සමස්ත ලංකා විචිත්‍ර පැළැටි හා උඩවැඩියා සමුපකාර සමිතිය | **12** |

# III පරිච්ඡේදය

- 2014 වර්ෂයේ ක්‍රියාකාරකම් සාරාංශය හා මූල්‍ය කාර්යඵල සාධනය

- වර්ෂය තුළ කරන ලද සාමාන්‍ය හා විශේෂිත කාර්යයන් සමාලෝචනය

# 2014 වර්ෂයේ ක්‍රියාකාරකම්වල සාරාංශය

| | | |
|---|---|---|
| 1. පවත්වා ඇති සමුපකාර සේවක වැඩමුළු | - | 16 |
| 2. බඳවා ගැනීම් අනුමත කිරීම් | - | 196 |
| 3. විස්තර ඉල්ලා යවා ඇති ලිපි, ච.ලේ. පිටපත් , ලිපි ගොනු ඉල්ලා එවා ඇති ලිපි ඇතුළු වෙනත් ක්‍රියා කළ ලිපි | - | 266 |
| 4. උපදෙස් ලබා දීම් | - | 144 |
| 5. නීති උපදේශන සේවා | - | 19 |
| 6. ආයතන සංග්‍රහයේ 5: 10: 2 අනුව එවා ඇති අභියාචනා | - | 02 |

# 2014 වර්ෂයේ කරන ලද කාර්යය සමාලෝචනය

2014 වර්ෂය තුළ සමුපකාර සේවක කොමිෂන් සභාවට විස්තර ඉල්ලා එවා ඇති ලිපි සහ උපදෙස් ඉල්ලීම් 410 කට පිළිතුරු ලබාදීමට 2014 දෙසැම්බර් 31 දින වන විට කටයුතු කර ඇත. සමුපකාර සේවකයන් හා සමුපකාර සමිති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට කොමිෂන් සභාවේ කටයුතු හා කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කළයුතු ආකාරය පිළිබඳවත් කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති සමුපකාර සේවක ආයතන සංග්‍රහය අනුව සමුපකාර සේවකයින්ට හිමිවන අයිතිවාසිකම් හා වරප්‍රසාද පිළිබඳවත් දැනුවත් කිරීම සඳහා 2014 වර්ෂය තුළ වැඩමුළු 16 පැවැත්වීමට සැලසුම් කළ අතර 2014 දෙසැම්බර් 31 දින වන විට එවැනි වැඩමුළු 16 ක් පවත්වා ඇත. මෙයින් වැඩමුළු 12 ක් පවත්වන ලද්දේ 2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහනට සමගාමීව කුරුණෑගල පුත්තලම දිස්ත්‍රික්කවල සමුපකාර සේවකයන් සඳහාය.







2014 දැයට කිරුළ
අපගේ ප්‍රදර්ශන
කුටියෙන්

# සමුපකාර සේවක වැඩමුළු 2014

දැයට කිරුළ (2014) ට සමගාමීව පැවැත් වූ වැඩමුළු

| | වැඩමුළු පැවැත්වූ ස්ථානය | වැඩමුළු පැවැත්වූ දිනය | සහභාගි වූ ගණන |
|---|---|---|---|
| 01 | සී/ස වයඹ පලාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගම් ශාලාව | 2014.01.24 | 81 |
| 02 | සී/ස වයඹ පලාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගම් ශාලාව | 2014.01.25 | 70 |
| 03 | දඹදෙනි පදනම් ආයතනය | 2014.01.26/27 | 104 |
| 04 | වාරියපොල පලාත් පුහුණු මධ්‍යස්ථානය | 2014.02.01 | 78 |
| 05 | වාරියපොල පලාත් පුහුණු මධ්‍යස්ථානය | 2014.02.02 | 70 |
| 06 | පඩුවස්නුවර වි.සේ.ස. සමිති ශාලාව | 2014.02.05/06 | 98 |
| 07 | පඩුවස්නුවර වි.සේ.ස. සමිති ශාලාව | 2014.01.24 | 102 |
| 08 | මාදම්පේ වි.සේ.ස. සමිති ශාලාව | 2014.01.25 | 34 |
| 09 | දඹදෙනි පදනම් ආයතනය | 2014.01.26/27 | 136 |
| 10 | මාදම්පේ වි.සේ.ස.සමිති ශාලාව | 2014.02.01 | 52 |
| 11 | පුත්තලම් ලුණු සමාගම් ශාලාව | 2014.02.02 | 43 |
| 12 | නිකවැරටිය | 2014.02.25/26 | 72 |

**මීට අමතරව සමුපකාර සමිතිවල සේවකයින් සඳහා වැඩමුළු 04 ක් පවත්වන ලදී.**

| | වැඩමුළු පැවැත්වූ ස්ථානය | වැඩමුළු පැවැත්වූ දිනය | සහභාගි වූ ගණන |
|---|---|---|---|
| 01 | පොල් ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ විනය කාර්යය පටිපාටිය පිළිබඳ පැවති සාකච්ඡාව | 2014.05.08,09 | 07 |
| 02 | කාන්තා සංවර්ධන සේවා සමුපකාර සමිති සේවකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව | 2014.12.03 | 75 |
| 03 | මුදුන් මට්ටමේ සමුපකාර සමිති සේවකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව | 2014.12.10 | 118 |
| 04 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2014.12.29 | 20 |

සමුපකාර සේවකයන්ට අදාළ නීතිමය ප්‍රශ්නවලදී අධිකරණයට සහය වීමත් කොමිෂන් සභාව වගඋත්තරකරු ලෙස නම්කර ඇති නඩු කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහය වීමත් මෙම කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයකි. එවැනි නඩු 11ක් සඳහා 2014 දී පෙනීසිටීමට සැලසුම් කළ නමුත් 2014 දෙසැම්බර් 31 දින වන විට එවැනි නඩු කටයුතු 19 ක් සඳහා කොමිෂන් සභාව වෙනුවෙන් නිලධාරීන් පෙනීසිට ඇත.

| නඩු අංකය | පැමිණිල්ල | විත්තිය | 2013.12.31 දිනට තත්ත්වය |
|---|---|---|---|
| 3267,3275,3276, 3277,3278,3279, 3280,3281,3284 | සී/ස කම්මල්පත්තු විවිධ සේවා සමුපකාර සමිතිය විසින් සේවයෙන් ඉවත් කළ සේවක පිරිසක් | සී/ස කම්මල්පත්තු පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය. (කොමිෂන් සභාව සාක්ෂි සඳහා කැඳවා තිබුණි.) | මාරවිල මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වේ. |
| 3265,3266,3269, 3270,3271,3273, 3274 | සී/ස කම්මල්පත්තු විවිධ සේවා සමුපකාර සමිතිය විසින් සේවයෙන් ඉවත් කළ සේවක පිරිසක් | සී/ස කම්මල්පත්තු පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය. (කොමිෂන් සභාව සාක්ෂි සඳහා කැඳවා තිබුණි.) | කොමිෂන් සභා තීරණය බල ගන්වා තීන්දුව දී ඇත. ඊට එරෙහිව සමිතිය විසින් අභියාචනා කර ඇත. |
| ක.වි.ස. 8/593/2011 | කේ.ඩබ්.පුෂ්ප කුමාර මයා | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | සාක්ෂි විමසීම (කොමිෂන් සභාවෙන් යවා ඇති ලිපි පිළිබඳ සාක්ෂි ලබා ගැනීම) |
| ක.වි.ස. 8/591/2011 | ඩී.ඩී.සී.පී .කුලරත්න මයා | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | සාක්ෂි විමසීම (කොමිෂන් සභාවෙන් යවා ඇති ලිපි පිළිබඳ සාක්ෂි ලබා ගැනීම) |
| CA(writ)/33/14 | කේ.එම්.සී.ජේ.බී කාංගර මයා | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | ලිඛිත දේශන ලබා දී ඇත. |

කොමිෂන් සභාවේ නිලධාරීන්ට කාර්යක්ෂම ලෙස රාජකාරී ඉටුකළ හැකිවන පරිදි පුහුණු වැඩමුළු සඳහා යොමු කිරීමද 2014 වර්ෂයේදී සැලසුම් කළ කාර්යයකි. කොමිෂන් සභාවට පත්කරන ලද උපාධිධාරී සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතන විසින් සංවිධානය කළ පුහුණු වැඩමුළු 11ක් සඳහා එම නිලධාරීන් සහභාගි වූ අතර, ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය විසින් පවත්වන ලද රියදුරන් සඳහා පුහුණු වැඩසටහන් 01ක් සඳහා ද තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන

අමාත්‍යාංශයෙන් පවත්වන ලද ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් සඳහා ද නිලධාරීන් සහභාගි කරවන ලදී.

## 2014 වර්ෂයේ පැවැත් වූ කාර්යය මණ්ඩල පුහුණු පාඨමාලා

| | නිලධාරියාගේ නම | තනතුර | පාඨමාලාවේ නම | දිනය |
|---|---|---|---|---|
| 01 | කේ.පී.ඩී. විජේවර්ධන මයා | රියදුරු | රජයේ වාහන පිළිබඳ පුහුණු පාඨමාලාව | 2014.01.16 2014.01.17 |
| 02 | එච්.එම්.ඒ. හෙන්නායක මිය | කළමනාකණ සහකාර | ප්‍රවාහන කළමනාකරණ පුහුණු පාඨමාලාව | 2014.01.28 |
| 03 | අයි.එම්.එස්.ජේ. ඉලංකෝන් මයා | කළමනාකණ සහකාර | විශ්‍රාම වැටුප් කටයුතුපිළිබඳ පුහුණු පාඨමාලාව | 2014.05.26 2014.05.27 |
| 04 | එච්.එම්.ඒ. හෙන්නායක මිය | කළමනාකණ සහකාර | විශ්‍රාම වැටුප් කටයුතුපිළිබඳ පුහුණු පාඨමාලාව | 2014.05.26 2014.05.27 |
| 05 | ඩබ්.කේ.එච්. වෙල්ලාල මහත්මිය. | සංවර්ධන නිලධාරි | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පිළිබඳ පුහුණු පාඨමාලාව | 2014.05.29 2014.05.30 |
| 06 | එච්.ඩී.එම්.ඩී කුලතුංග මිය | සංවර්ධන නිලධාරි | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පිළිබඳ පුහුණු පාඨමාලාව | 2014.05.29 2014.05.30 |
| 07 | එස්.ඒ.එම්.එස්. විජේරත්න මහතා | රියදුරු | රිය පැදවීම පිළිබඳ පුහුණු පාඨමාලාව | 2014.06.27 |
| 08 | එච්.ඩී.එම්.ඩී කුලතුංග මිය | සංවර්ධන නිලධාරි | වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණු පාඨමාලාව | 2014.08.07 2014.08.08 |
| 09 | ඩබ්.කේ.එච්. වෙල්ලාල මහත්මිය. | සංවර්ධන නිලධාරි | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු පාඨමාලාව | 2014.08.27 2014.08.28 |
| 10 | එච්.එම්.ආර්. මල්කාන්ති මෙය | සංවර්ධන නිලධාරි | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පිළිබඳ පුහුණු පාඨමාලාව | 2014.09.01 2014.09.02 |
| 11 | ජේ.ඒ.ටී.පී. ජයකොඩි මෙනවිය | කළමනාකණ සහකාර | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පිළිබඳ පුහුණු පාඨමාලාව | 2014.09.01 2014.09.02 |
| 12 | මෙම කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය | සියළුම නිලධාරීන් | ගැටුම් නිරාකරණය හා අභියෝග වලට මුහුණදීම | 2014.09.16 |

| | | | | |
|---|---|---|---|---|
| 13 | අයි.එම්.එස්.ජේ. ඉලංකෝන් මයා | කළමනාකරණ සහකාර | මානව සම්පත් පිළිබඳ පුහුණු පාඨමාලාව | 2014.09.17<br>2014.09.19 |
| 14 | මෙම කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය | සියළුම නිලධාරීන් | කාර්යක්ෂමතාව නැංවීම සඳහා ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන | 2014.11.24 |
| 15 | එච්.එම්.ආර්. මල්කාන්ති මෙය | සංවර්ධන නිලධාරි | රජයේ නිලධාරීන්ට අදාල නීතිමය විධිවිධාන පිළිබඳ පුහුණු පාඨමාලාව | 2014.11.25 |
| 16 | මෙම කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය | සියළුම නිලධාරීන් | සංශෝධිත ආයතන සංග්‍රහයේ පරිපාලන කාර්ය පරිපාටි සහ විධි | 2014.11.29<br>2014.11.30 |
| 17 | මෙම කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය | සියළුම නිලධාරීන් | ආයතන සංග්‍රහයට අදාළව | 2014.12.04 |

*** ඉහත කාර්යයන්ට අමතරව 2014 වර්ෂයේ කොමිෂන් සභාව විසින් ඉටුකළ**




**විශේෂ කාර්යයන්**

1) විනය පරීක්ෂණ නිලධාරි සංචිතය හා අභියාචනා පරීක්ෂණ නිලධාරි සංචිතය පත් කර සමිතිවලට මේ පිළිබඳ දැනුම් දී ඇත.


2) සමුපකාර සේවකයන් සඳහා 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද 2007/5 දරණවැටුප් චක්‍රලේඛනය වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සංශෝධනය කිරීම සඳහා පත්කර ඇති කමිටුව මේ වන විට රැස්වීම් පවත්වා සංශෝධන කටයුතු ආරම්භ කර ඇත.

**ඉහත කාර්යයන් සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන හා ඒ සඳහා 2014 වර්ෂයේදී දරන ලද වියදම්**


| | **ක්‍රියාකාරකම** | **අයවැය ඇස්තමේන්තුව** | **ශුද්ධ ප්‍රතිපාදන (මු.රෙ.66 මාරු කිරීම් ඇතුළත්)** | **2014.12.31 දිනට වියදම** | **ඉතිරිය** |
|---|---|---|---|---|---|
| 01 | සේවක අභියාචනා විභාග කිරීම. | - | - | - | - |
| 02 | නීති උපදේශන සේවා | - | - | - | - |
| 03 | සමුපකාර සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 600,000.00 | - | 596,618.00 | 3382.00 |
| 04 | කාර්යමණ්ඩල පුහුණු වැඩසටහන් සඳහා | 100,000.00 | 426,000.00 | 426,000.00 | - |
| 05 | 2007/05 චක්‍රලේඛය සංශෝධනය කිරීම | - | - | - | - |




| | 2013 | 2014 |
|---|---|---|
| වැටුප් | 5,312,353.88 | 6,182,797.60 |
| ගමන් වියදම් | 294,018.50 | 21,073.50 |
| සැපයීම් සේවා | 923,261.19 | 779,059.00 |
| නඩත්තු වියදම් | 920,314.32 | 548,488.93 |
| ගිවිසුම්ගත සේවා | 2,893,620.13 | 3,410,666.76 |
| මාරුකිරීම් | 23,617.43 | 22,700.83 |




| | 2013 | 2014 |
|---|---|---|
| පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 442,321.00 | 1,022,618.12 |
| ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 210,850.00 | 376,638.79 |




| | 2013 | 2014 |
|---|---|---|
| 1 වන කාර්තුව | 2,426,763.99 | 2,664,457.29 |
| 2 වන කාර්තුව | 2,456,606.45 | 3,265,882.76 |
| 3 වන කාර්තුව | 2,514,412.45 | 2,913,784.36 |
| 4 වන කාර්තුව | 3,622,563.56 | 3,647,511.22 |

## 2015 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ ව්‍යාපෘති

පහත සඳහන් ව්‍යාපෘති 2015 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාව විසින් සැලසුම් කර ඇත.

| | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති කාලසීමාව | ඇස්තමේන්තු මුදල | අරමුදල් ප්‍රභවය | අරමුණු |
|---|---|---|---|---|---|
| 01 | සමුපකාර නීතිය හා විනය ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු 12 ක් පැවැත්වීම. | 2015 ජනවාරි-දෙසැම්බර් | රු.635,000 | අයවැය ප්‍රතිපාදන | සමුපකාර ව්‍යාපාරය හා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම. |
| 02 | කොමිෂන් සභා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම. | 2015 ජනවාරි-දෙසැම්බර් | රු.100,000 | අයවැය ප්‍රතිපාදන | කොමිෂන් සභා කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම. |
| 03 | 2007/5 වැටුප් චක්‍ර ලේඛය සංශෝදනය | 2015 | - | - | වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සංශෝදනය කිරීම |

## * 2014 වර්ෂය තුළ තනතුරු සඳහා බඳවා ගැනීම්

| | සමුපකාර සමිතියේ නම | තනතුර | අනුමත සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | සහකාර ගණකාධිකාරී | 04 |
| 02 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | ගණකාධිකාරී සහකාර | 03 |
| 03 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | ගණකාධිකාරී | 01 |
| 04 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | කළමනාකරණ සහකාර | 109 |
| 05 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | කා.කා.ස | 11 |
| 06 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | නි. සාමාන්‍යාධිකාරී පළාත් | 02 |
| 07 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | සාමාන්‍යාධිකාරී (කොන්ත්‍රාත් පදනම මත) | 01 |
| 08 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | සහකාර අභ්‍යන්තර විගණක | 14 |
| 09 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | සහකාර සාමාන්‍යාධිකාරී | 05 |
| 10 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | සාමාන්‍යාධිකාරී (111) | 01 |
| 11 | සී/ස තැපැල් ටෙලිකොම් සේවක සමුපකාර සමිතිය | කළමනාකරණ සහකාර | 03 |
| 12 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | රියදුරු | 02 |
| 13 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | කම්කරු (11) | 02 |
| 14 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | කළමනාකරණ සහකාර | 01 |
| 15 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | පරිගණක ක්‍රියාකරු | 06 |
| 16 | සී/ස සමුපකාර අලෙවි සංගමය | කම්කරු | 09 |
| 17 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | සේවා ප්‍රවර්ධන නිලධාරී | 04 |
| 18 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | ගණකාධිකාරී (111) | 01 |
| 19 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | අයකැමි | 10 |
| 20 | සී/ස තැපැල් ටෙලිකොම් සේවක සමුපකාර සමිතිය | පරිපාලන නිලධාරී | 01 |
| 21 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | කළාප කළමනාකරු | 04 |
| 22 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | අයකැමි (111) | 01 |
| 23 | සී/ස. වතු සේවා නිලධාරීන්ගේ නිවාස සමුපකාර සමිතිය | කළමනාකරණ සහකාර (111) | 01 |

2014 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම

අනුව අපේක්ෂිත වැඩසටහන් සහ අවසන් කර ඇති වැඩසටහන්

| වැඩ සටහන | අපේක්ෂිත ඉලක්කය | අවසන් කර ඇති ප්‍රමාණය | වෙනස | | වෙනසට හේතු |
|---|---|---|---|---|---|
| | | | අඩු | වැඩි | |
| සමුපකාර සමිති සේවකයින් හා අධ්‍යක්ෂ මණ්ඩල දැනුවත් කිරීමේ වැඩමුළු | 16 | 16 | - | - | - |
| අභියාචනා සහ පැමිණිලි විභාග කිරීම | 500 | 411 | 89 | - | අභියාචනා සහ පැමිණිලි වල තොරතුරු අසම්පූර්ණ වීම |
| කොමිෂන් සභාවට විරුද්ධව ගොනු කර ඇති නඩු/ සාක්ෂිකරු කර ඇති නඩු/ කොමිෂන් සභාව විසින් පවරා ඇති නඩු | 11 | 19 | - | 08 | - |
| කාර්යාල නිලධාරින් පුහුණු කිරීම් | 10 | 17 | - | 07 | - |